# ශ්‍රී ලංකාවේ ළමා වැරදිකරුවන් පුනරුත්ථාපනය පිළිබඳ මනෝවිද්‍යාත්මක අධ්‍යයනයක්.

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**එච්.කේ.ඩී.එම්.සී. වීරසිංහ** [1]

**ඩී.ඩී.ආර්. දිලක්ෂි ද සිල්වා** [2]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවෙහි ළමා වැරදිකරුවන් පුනරුත්ථාපනය කිරීම සඳහා නොයෙකුත් ආයතන ස්ථාපිතව පවතියි. මෙම අධ්‍යයනයෙන් එම ආයතන මඟින් පුනරුත්ථාපන ක්‍රියාවලිය සිදුවන ආකාරය පිළිබඳ මනෝවිද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කෙරේ. එම ආයතනය මගින් පුනරුත්ථාපන ක්‍රියාවලිය නිසියාකාරව සිදුවේද ? යන්න මෙම අධ්‍යයනයේ ගැටලුව වේ. මෙහිදී දත්ත රැස් කිරීම සඳහා විවිධ ක්‍රම ශිල්ප භාවිත කරයි. එහි දී සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ, ප්‍රශ්නාවලි හා ප්‍රත්‍යෙක අධ්‍යයන මගින් දත්ත ලබා ගෙන ඇත. නියැදිය තෝරා ගැනීමේ දී පුනරුත්ථාපන ආයතන ත්‍රිත්වයකට සීමා කිරීමට සිදු විය. මීගමුව 'නිසල දිය සෙවෙන' කාන්තා රැඳවුම් නිවාසයත්, කළුතර - මග්ගොන ශාන්ති විසෙන්ති පිරිමි අනුමත නිවාසය සහ වටරැක එළිමහන් බන්ධනාගාර වැඩ කඳවුර නියැදිය වශයෙන් තෝරා ගන්නා ලද අතර සරල සසම්භාවී නියැදුම් ක්‍රමයට අහඹු ලෙස ළමුන් 50දෙනෙක් තෝරා ගෙන අධ්‍යයනය කර ඇත. දත්ත විශ්ලේෂණය සඳහා Excel සංඛ්‍යානමය මෘදුකාංගය භාවිත කරයි. ප්‍රතිඵල ගණනය කිරීමේ දී ළමුන්ගේ අධ්‍යාපන මට්ටම, වයස් සීමාව, පුනරුත්ථාපන ආයතනයට පැමිණීමට බලපාන ලද මානසික හේතු හා පවුල් පරිසයේ දුර්වලතා මෙන්ම ආයතනගත පුනරුත්ථාපන වැඩසටහන් හා ආයතන තුළ සිදුවන වෘත්තිමය පුහුණුව ආදී කරුණු මත වර්ග කර ඇත. එහි දී මුළු සංඛ්‍යාවෙන් 70%ක් වයස අවුරුදු 16ත් 18ත් වයස් මට්ටම්වල ළමුන් වන අතර ඔවුන්ට අධ්‍යාපනය නතර කිරීමට බලපෑ ප්‍රධාන හේතුව වී ඇත්තේ ළමුන් විසින් සිදු කරන ලද වැරදි වේ. එය මුළු සංඛ්‍යාවෙන් 32% කි. මව හා පියා ජීවත් ව සිටිය ද ළමුන්ට නිසි රැකවරණය නොලැබීම හේතුවෙන් ළමුන් වැරදිවලට පෙළඹී ඇත. එලෙස වැරදි වලට යොමු වීමේ ප්‍රවණතාවය මුළු සංඛ්‍යාවෙන් 30%ක ප්‍රතිශතයකි. පුනරුත්ථාපන ක්‍රියාවලිය පිළිබඳ සැලකීමේ දී ඔවුන්ට වැඩි වශයෙන් ආයතන තුළ ලැබෙන වෘත්තීය පුහුණුව වන්නේ විදුලි කාර්මික පුහුණුවයි. එය මුළු සංඛ්‍යාවෙන් 26% කි. නමුත් පුනරුත්ථාපන ආයතන තුළ ළමුන්ගේ මානසික මට්ටම් වල වෙනස්කම් දැකිය හැකිය. මානසික නිදහස ළමුන්ට නොලැබීම එහි දී ඉස්මතුව පෙනෙන ප්‍රබල කාරණයකි. එය ප්‍රතිශතයක් ලෙස ගත් විට 26% වේ. ළමුන්ගේ අනාගත අපේක්ෂාවන් සැලකීමේ දී 36%ක් අපේක්ෂා කරන්නේ හොඳ රැකියාවක් කිරීමටය. ඒ අනුව අධ්‍යයනය අවසානයේ ලබා ගත හැකි නිගමනය වන්නේ ආයතන තුළින් ළමුන්ට වෘත්තිය අධ්‍යාපන ලබා දුන්නද මානසික වශයෙන් නිදහසක් ඒ තුළ දක්නට නොලැබීමයි. එහෙයින් මානසික සංවර්ධනය ඇති කිරීම වැදගත් වේ.

---

*1. මනෝ විද්‍යාව, දර්ශන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දර්ශන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*